විද්‍යාලය : ර/ ඇඹේපොල ශ්‍රී මහින්ද මහා විද්‍යාලය
සිංහල භාෂාව හා සාහිත්‍යය : 13 ශ්‍රේණිය පැවරුම්
විෂය භාර ගුරු : ඊ.ඒ.එස්.එච්. ඇතුල්දූර
**නිර්දේශිත ග්‍රන්ථය : පේමතෝ ජායතී සෝකෝ**

**''සරච්චන්ද්‍රයන්ගේ නාට්‍ය කලාව විශ්ව සාහිත්‍යට එක් වීමට එක් හේතුවක් වූයේ, ඔහු යොදා ගත් කාව්‍යාත්මක භාෂාවයි.'' 'පේමතෝ ජායතී සෝකෝ ' නාට්‍ය තුළින් නිදසුන් දක්වමින් මෙම කියමන විමසන්න.**

භාෂාව යනු මිනිසාගේ අදහස්, හැඟීම් හා අභිලාෂයන් සන්නිවේදනය කරවන මාධ්‍යයයි. මිනිසාගේ සන්නිවේදන මාධ්‍ය අතුරින් ප්‍රධාන මාධ්‍ය වනුයේ ද භාෂාවයි. අලුත් අදහස් නිර්මාණය කළ හැකි වීම භාෂාවේ විශේෂ ලක්ෂණයකි. සාහිත්‍ය නිර්මාණ පහළ වන්නේ එම ලක්ෂණය හේතුවෙනි. මිනිසාගේ ප්‍රධාන සන්නිවේදන මාධ්‍ය වන භාෂාව සාහිත්‍යයේ ද මාධ්‍ය වන බැවින් එය ඉතා ඉහළ ශක්‍යතාවකින් යුක්ත කලා මාධ්‍යයක් වේ. නාට්‍ය කලාවේ සතර අභිනය අතුරින් වාචිකාභිනය දක්වෙනුයේ භාෂාව මාර්ගයෙනි.

මහාචාර්යය එදිරිවීර සරච්චන්ද්‍ර මහතා ඉකුත් සියවසේ මෙරට සිටි අග්‍රගන්‍ය කවියෙකි. මහාචාර්යය සුනිල් ආරියරත්නයන් විසින් ඔහුව හඳුන්වා ඇත්තේ 'කවියට ඉන්ද්‍ර වූ සරච්චන්ද්‍ර' යනුවෙනි. (ඒ 2007 ජූලි මස 10 දින ලංකාදීප පුවත්පත විමංසා අතිරේකයේ ලිපියකය.)

සරච්චන්ද්‍රයන් කිසිදු කේවල කාව්‍ය නිර්මාණයක් කර නැත. ඔහුගේ කවීත්වය ප්‍රකට කරනුයේ ඔහු විසින් රචනා කරන ලද නාට්‍ය, නවකතා, චම්පූ කාව්‍ය ආදියෙහි ය. ගුණදාස අමරසේකරයන් ද ඔහුගේ 'සිංහල කාව්‍ය සම්ප්‍රදාය' නම් කෘතියේ සරච්චන්ද්‍රයන්ගේ කවි බස පිළිබඳ විශේෂයෙන් සාකච්ඡා කොට තිබේ. ඔහු පවසන ආකාරයට සරච්චන්ද්‍රයන්ගේ කවි බස 13 වෙනි සියවසින් පසු දිගින් දිගට ම පැවත ආ අපගේ කවි බසෙහි සම්පිණ්ඩනයකි.

සරච්චන්ද්‍රයන් එදා-මෙදාතුර සම්භාව්‍ය කවියෙහි බස මෙන් ම ජන කවියෙහි බස ද එක්තැන් කරමින් වත්මන් සහෘදයා වෙත කලාත්මක මෙන් ම කාව්‍යාත්මක භාෂාවක් ලබා දීමට උත්සාහ ගෙන ඇත. ඒ බව ඔහුගේ සිංහබාහු. මනමේ, පබාවතී, ලෝමහංස, පේමතෝ ජායතී සෝකෝ නාට්‍ය මගින් මනාව ස්ඵුට වේ.

කවිබස සොයන වත්මන් කවියාට සරච්චන්ද්‍රයන්ගේ නාට්‍ය කෝෂ්ඨාගාරයකි.(ගබඩාවකි.) නිර්මාණාත්මක සාහිත්‍යයේ දී උචිත වනුයේ ඍජු ප්‍රකාශ පළ කරන භාෂාව හෝ වාර්තාරූපී භාෂාව නොවේ. මනෝභාවයන් හෙවත් හැඟීම් උද්දීපනය කරන භාෂාවයි. නිර්මාණ රසාවහ ගුණයෙන් යුක්ත වනුයේ එසේ වූ කල්හිය. සරච්චන්ද්‍රයන් ඔහුගේ 'සාහිත්‍ය විද්‍යාව' නම් කෘතියේ මේ බව සඳහන් කර ඇත.

කාව්‍යෝක්ති භාවිතය, ඖචිත්‍යපූර්වක වාග් මාලාව, පූර්ව කවීන්ගේ උසස් නිර්මාණවල ආශ්‍රය ලබා ගැනීම, දාර්ශනික අදහස් කුළුගැන්වීම ආදී වශයෙන් සරච්චන්ද්‍රයන්ගේ කාව්‍ය භාෂාවේ සාධනීයතා හඳුනා ගත හැකි වේ.

ප්‍රේමය, ජීවිතය ගැන රමණීයතම අදහස් පළ කළ කවියා ඔහු ය. එවන් වූ අනුස්මරණීය ප්‍රකාශ කීපයකි මේ.

''ලෝ දහමින් වැදෙනා රළු පහරින්
ගත සිත රිදෙනා කල නිතියෙන්
නැත ලොවේ අන් රසඳුනා
ආදරය සේ සුවදෙනා''

''අසිරිමත් වූ දෙයකි සෙනෙහස
වැනූ පොරණ කිවිඳුන් සොඳ රසමුසු බසිනා
සියලු ඉසුරු වස්තු භෝග හරිති නෙක් දනෝ
සව් සැප දෙන සිතුමිණ වන් ප්‍රේමය සන්දා'' (සිංහබාහු නාට්‍යය)

''ප්‍රේමය නම් අසනිය කුසුමක් වේ
රිසි වූ කෙනෙකුට පූජා කරන්න
ලෝබ සිතින් තොා පිදුව මනා වේ
පෙරළා ලබන්ට නොසිතා බිඳකුත් ''

සරච්චන්ද්‍රයන්ගේ කවි බසෙහි විශේෂත්වයක් වන්නේ උචිත පරිදි අලංකාරෝක්ති භාවිත කර ඇති අයුරුයි. කාව්‍ය ශෝභාව උපදවන සිය ගණනක් අංගයන් අතුරින් 'පේමතෝ ජායතී සෝකෝ ' නාට්‍යයෙන් නිදසුන් කිහිපයක් ගෙනහැර දැක්වීම ප්‍රමාණවත් යැයි සිතමි.

උපමා, රූපක, සංකේත, අතිශයෝක්තිය, ස්වභාවෝක්තිය, සමාසෝක්තිය, විශේෂණ අලංකාර, පඬි වදන්, ලෝක ප්‍රකට වදන්, කෘදන්ත නාම රාශියක් ඇසුරු කොට ගනිමින් විශේෂණවත් භාෂා ශෛලියක් අනුගමනය කර ඇති බව පේමතෝ ජායතී සෝකෝ නාට්‍යය අධ්‍යයනයේ දී මැනවින් ගම්‍යමාන වේ
.

**මේ ගීතාංක නාටකය අති සාර්ථක වීමට ඒවා හේතු වූ අයුරු මෙසේ විමසා බලමු.**

**සැ.යු. :** අවශ්‍ය පරිදි පහත සඳහන් උද්ධෘත සමග ඔබේ අදහස් දක්වන්න.

**උපමා** : ''පුලිඟු මෙන් අළු අතර සැඟවී
තිබේ දැවෙමින් හවේ ආසා....''

''නුවනගින් දෙන බැලුම්
හෙළන වැනි දූල අවට....''

''ළඳකගේ ඇස් මිණි පහන් ලෙස
දිලෙන බව නෙක් කවීන් කී බස....''

''මන්ද සරයෙන් බිඳුණු කල ඇ
සිරුරෙ ගැල් වූ සිහිල් අඳුනක්....''

''සේය දනුනේ ඇදුරුතුමා හට
දන් බලනු කොහිද ඇ....''

''ළහිරු මඬලක් ලෙසට
රුවන් රැස් විහිද වූ....''

''ඇස වැටුණු දූලි රොද
පිස දමා හරින මෙන්....''

''ගල් ටැඹක් සේ නොසැලෙනා අප
ඇදුරුතුම අද පරඬැලක් සේ ....''

**රූපක** :

''කෙලෙස් මලයෙන් මලින සතහට
ගොදුරු වී තම සිතැඟි පාසෙහි
සැරිසරන තෙක් සසර සයුරේ
පැමිණෙනා නෙක් වැසෙන ගොර දුක් :
මරණ පහුරේ නැගී නෙක වර
භවයෙකින් තව භවයකට වන්
නිවන් වෙරළෙහි ගොඩ බසින තෙක්
වැගිරෙනා නෙක් කඳුළු දහරා :

''සිප් සයුරෙ පතුලට ම කිමිදෙමින්....''

''...සිත් මසුන් ඩැහැ ගන්ට....''

''මා නිසා නෙත් මිණි පහන් තුළ
දල්වනුය පෙම් දැල්ල නොනිවා
එකලු කරනුය ම හද මැදුරත....''

''පොපි දෙවා මුව තඹර තොල්පෙති....''

''කල්පනා ගංගාවේ
පාවෙමින් යන ඔරුව....''

''ජීවිතේ සාගරේ
පාවෙමින් යන ඔරුව....''

''හදවත් කතරේ මලකි පිපෙන්නට ''

**අතිශයෝක්තිය** :

''ස්වර්ණතිලකා වීය ඇගෙ නම
ස්වර්ණ වර්ණය ඇගේ දේහය
ස්වර්ණ මාලා කළඹ සදිසිය
සිහින් සිරුරින් නිකුත් රශ්මිය
මෝහ කරවන දනන් චිත්තය ''

**ස්වභාවෝක්තිය** :

''මුළු ගත වෙවුලයි දහඩිය වැගිරෙයි
කිසි කල නැත අප ඔබතුම දුටුවේ
මේසා චංචල ගතියෙන් පසුවන ''

**සමාසෝක්තිය** :

(ප්‍රස්තුතයෙන් පරිබාහිර යමක් කැටිකොට දක්වා ප්‍රස්තුතය හැඟවීමට හැරීම මෙහි ලක්ෂණයයි.)

''පසිඳුරන් දොරටු රැකි මුර පිරිස්
පරාද වී පලා ගියෝ....''
(උද්දාල බමුණාගේ සිතෙහි පැවති ස්ථාවර භාවය බිඳවැටෙන අයුරු ඉන් ගම්‍ය වේ.)
''කල්පනා ගංගාවෙ
පාවමින් යන ඔරුව
ගොඩබිමක් නොම සොයන
ගොඩබිමෙන් යන ඇත
පරතෙරෙන් නොපතා ම ''

(ගංගාවක් හා ඔරුවක් ඇසුරින් ඔහුගේ ජීවිතය ගමන් කරන දිහාවෙහි වෙනස්වීම පිළිබඳ ඉදිරිපත් කරයි.)

**විශේෂණඅලංකාරඃ** විශේෂණවත් භාෂාව අවැසි තන්හි දී එය අනුගමනය කිරීමට ද සරච්චන්ද්‍ර පසුබට ව නැත.දේශීය ගැමි නාටක, ජන බස, ජන කවිය මෙන් ම උත්තර භාරතීය සංගීතය ද මනාව සංකලනය කරමින් ' පේමතෝ ජායතී සෝකෝ ' නම් වූ ගීතාංග නාටකය අලංකාර කාව්‍යයක් බවට පත් කිරීමට හැකියාව ලැබුණේ ඔහු සතු නිසග කවිත්වය හේතුවෙනි. ගායක කණ්ඩායම ලවා ස්වර්ණතිලකා වේදිකාවට හඳුන්වා දෙන අවස්ථාවේ ඇගේ නම රූසපුව ආශ්‍රය කොට ගත් විශෙෂණ හා අලංකාර ඖචිත්‍යයෙන් යුතුව භාවිත කොට ඇත.

''ස්වර්ණතිලකා වීය ඇගෙ නම
ස්වර්ණ වර්ණය ඇගේ දේහය
ස්වර්ණ මාලා කළඹ සදිසිය
සිහින් සිරුරින් නිකුත් රශ්මිය
මෝහ කරවන දනන් චිත්තය
වර්ණ ගන්ධ ස්පර්ෂ ඇ යුතු
දුටු ඇසිල්ලෙහි රාග මොලවන
ඇගේ නම විය ස්වර්ණතිලකා ''

සරච්චන්ද්‍රයන් නාට්‍ය රසෝද්දීපනය සඳහා කාව්‍යාත්මක බස් වහරකින් (ආප්තෝපදේශ/පඬිවදන්) ඉදිරිපත් කර ඇත්තේ මෙසේය.

''මැණික නම් මැණික වෙ
කිලුටු පස් යට තිබුණ මුත්
මැණික නම් මැණික වේ
අගය දත් නැණැතියෝ
නොම හරිති කිසි ලෙද
සතුරන් දහසක් කළ ද පරාජය
තම හට තම සිත වේ පස මිතුරා
සිංහ රාජා සිවල් ඩේනුව
සමග කවදා වේද වාසේ ''

ස්වර්ණතිලකා, උද්දාල බමුණා හුදෙකලා වූවකු නොවන බවත් ඔහුගේ ශිෂ්‍යයන් ඔහු පිළිබඳ සෙනෙහසින් යුතු ව කටයුතු කරන බවත් පවසන අවස්ථාවේ දී

කෘදන්ත නාම රාශියක් භාවිතා කරමින් විශේෂණවත් භාෂාවක් භාවිත කර ඇත්තේ මෙසේ ය.

''මානවකයෝ සෙනේ ඇතියෝ
ඔබතුමාගේ හිත පතන්නෝ
බැතිසිතින් ඔබහට පුදන්නෝ
සියලු සැපදුක් ගැන බලන්නෝ
කලණ මිතුරෝ නොවෙත් දෝ ඔහු ?
හුදෙකලා විය හැක්කෙ කෙලෙසද ? ''

නාට්‍යයේ රසෝද්දීපනයටත් ප්‍රේක්ෂක හදවත් අමන්දානන්දයට පත් කිරීමටත් ප්‍රේක්ෂක, පාඨක හා විචාරක පැසසුමට ලක්වීමටත් පහත ගීතය බෙහෙවින් ඉවහල් වේ.

''ඇදුරුතුමා වන්න මගේ
නුදුන් නමුත් ශිල්ප ශාස්ත්‍ර
ජීවිතයේ ගිරි දුර්ගය
නගින්න අත් වැලක් දෙන්න
මහට දෙන්න ගුරු උපදෙස්
වියෝ වෙතත් මා ඔබගෙන්
නිරන්තරව සිහියට එන
සමීපයෙන් ඉවත් නොවී
දුකටත් සැපටත් දෙකට ම
නොහරින හිත මිතුරෙකු සේ ''

**සරච්චන්ද්‍රයන්ගේ කවිකමේ මහිමයත් නාටකය සාර්ථක වීමට කාව්‍යමය බස්වහර ඉවහල් වූබවත් ප්‍රකාශ කරමින් පිළිතුර අවසන් කරන්න.**

ඇමිලෙව් මීඩ්